24 වැනි පිටුවෙන් ...

පැත්තට නිතර එනවා. සෙන්තුල් එකටත් යනවා. ඔහු විදහා දැක්වූයේ බොහොම දර්ශනීය චිත්‍රයක්.'

'එතකොට වැඩ කරන්නෙ?'

'ෂාලුම් කොම්පැණියක. අවුරුදු තුනකට තමයි ඇවිල්ල ඉන්නෙ. ඒත් ලබන අවුරුද්දෙ යනව බඳින්නත් එක්කම. අන්කල් බුදුන් වැඳල එන්න.'

මම බුදු ගෙයින් එලියට එන කොටම මිනිහ දුවගෙන ආවා.

'අංකල්. ලකී තේ ටිකක් හැදුවා. යමු බොන්න.'

'හා හොඳයි'

'එහෙනම් ගුණනාත් මට පන්සලේ වැඩ වගයක් කරන්නත් තියෙනවා. වෙලාවක මට කතා කරන්නකො. මෙන්න මගේ නොම්මරය. මේ දවස් වල මම විතරයි ගෙදර ඉන්නෙ ඒ නිසා හවසක එන්න.'

'හා හොඳයි අංකල් මෙන්න මගේ නොම්මරය.'

' ඒක එහෙනම් මගේ ෆෝන් එකටම දාන්න. නැතිනම් නැතිවෙයි'.

'Gnath 016732 ....'

'හොඳයි එහෙනම් පස්සෙ හමු වෙමු'

මිනිසුන්ගේ මුහුණේ ඉරියව් කතා බහ අනුව ඔවුන් හඳුනා ගැනීමට ශක්තියක් ඇති මම ඔහු දුටුවේ අවංක තරුණයෙකු ලෙස. සමහර විට මට මෙයාව අපේ පුතා සමග සැසඳෙන්න ඇති.

'කතාවෙන් කතාවෙන් ගෙදර ළඟටම ඇවිල්ල නේ.'

'රණේ මේ ශ්‍රියාණි. ශ්‍රියාට මතකද ප්‍රොෆෙසර් රණබන්ඩු. අපට වඩා අවුරුදු දෙක තුනකට සීනියර්. ඉකොනොමික්ස් කළේ.'

'එතකොට අර ප්‍රියංකා ගොරකදෙනිය හිටියෙ ඔයාල එක්කද?'

'ඔව් ඔව් එයා තමයි මගේ රූම් මේට්,. රාමනාදන් ඉන්නකොට. මොකද දන්නෙ නැහැ බන්ඩු නේද? මනෝ රංජනී කොහෙද්ද' ඇය සිනාසෙයි.

'අනේ නෑ ශ්‍රියාණි. එයා මගේ නංගිගෙ ක්ලාස් මේට් කෙනෙක්. ඒ නිසා දන්නව.'

'සර් මැරි කළේ අර ධම්මිකා රණගලවද? නැත්නම්.....'

'ඔව් ඔව් ඔයාට මතකද ධම්මිව?'

'නැතුව නැතුව එයත් රාමනාදන් හිටියනේ කාලයක්. සර් ඒ කාලෙ රාමනාදන් එන කොට අපි කියන්නෙ, ඉල්ලුම් සැපයුම් වක්‍ර ගසාගෙන - රණයා එනවා ප්‍රේමෙ සොයාගෙන කියලනේ.' ඇය මහ හඬින් හිනැහෙයි.

'බලන්න බන්ඩු, ඒ කාලෙ ගෝලයො අපිට කාඩ් ගහල තියෙන හැටි'

'ශ්‍රියා මම මේ රණේට කිය කියා හිටියේ අර ජිනාත් ගෙ කතාව. මොකද රණේ තව පොතක් ලියනවලු.'

'ඒක නම් හොඳයි. ඒ වගේ කතාවල් ලියල මිනිස්සු දැනුවත් කරවන්න ඕන. නැතිනම් නොදන්න මිනිස්සු ගරහන්නෙ මුළු සිංහල ජාතියටම. ඒක අපිටත් ලජ්ජාවක්.'

*ඉතිරිය ලබන කලාපයේ...*